# මහනුවර ගොඩමුන්න ග්‍රාමයේ සගම රජමහ විහාරයේ වාර්ෂිකව සිදු කරන හම්බා කෙටීම හා කිරිබඩ පාත්‍ර පූජාව පිළිබඳව විමසුමක්

ජයසිංහ ජේ.එම්.සී.එච්.

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

chamodikahansini@gmail.com

**සාරසංක්ෂේපය**

කිසියම් සමාජයක සංස්කෘතිය පිළිබිඹු කරන එක් පැතිකඩක් වන්නේ පාරම්පරික සිරිත් විරිත්ය. මහනුවර ගොඩමුන්න ග්‍රාමයේ ඓතිහාසික සගම රජමහ විහාරයේ වාර්ෂිකව සිදු කරන හම්බා කෙටීම හා කිරිබඩ පාත්‍ර පූජාව නම් චාරිත්‍රය පාරම්පරික සිරිත් විරිත් විදහා දක්වන අංගයකි. සගම රජමහ විහාරයේ අලුත් සහල් මංගල්‍යයට අදාළව සිදු කරන දවස් හතකින් සමන්විත මෙය දවස් පහක් මල් පෙරහැරකින්ද එක් දිනක් බුදු මඟුල නම් පෙරහැරකින්ද අවසන් දින දාන පාත්‍ර පූජාවෙන්ද අවසන් වෙයි. මෙම පිංකම සිදු කිරීමේදී අනුගමනය කරන සිරිත්විරිත් හා අතීත සම්ප්‍රදායන් හැදෑරීම පර්යේෂණ අරමුණයි. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ගොඩමුන්න ග්‍රාමයේ පුද්ගලයන් 10ක නියැදියක් ගෙන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. සිංහල දෙමළ අලුත් අවුරුදු දිනය අවසන් වී දින තුනකින් පිංකම සිදු කරන අතර ඊට ප්‍රථම මේ පිළිබඳව ගම්මුන් එකව ගොඩමුන්න ඓතිහාසික අම්බලමේදී සාකච්ඡා කරනු ලබයි. පසුව මෙම ඓතිහාසික පෙරහැර සඳහා තාවකාලික කොමිටියක් පත් කර ගන්නා අතර එහිදී පිංකම සඳහා වී, සහල්, පොල්, මුදල් කොපමණ ප්‍රමාණයක් ගම්මුන්ගෙන් අය කර ගන්නේද යන්න පිළිබඳව සාකච්ඡා කරයි. පෙරහැරට පෙරදා ගම්වැසියන්ගෙන් දානය සඳහා එකතු කර ගන්නා ලද වී ගොඩමුන්න ධර්මශාලාවට රැගෙන ගොස් සුදු පිරුවට ඇඳ ගත් පිරිමි පක්ෂය දිය නා පිරිසිදු වී දේව කන්නලව්වෙන් හා මඟුල් බෙර වැයීමෙන් පසු එම වී ඔරුවක හැඩය ඇති වංගෙඩියකට දමා කොටනු ලබයි. මෙය 'හම්බා කෙටීම' නම් වෙයි. මෙකී කටයුතු සඳහා එකම කාන්තාවක්වත් සහභාගී නොවීම එදා සිට අද දක්වා පැවතෙන සම්ප්‍රදායකි. පුරා දින හයක් ආගමික වතාවත්වල යෙදෙමින් කරනු ලබන මෙම පිංකම හත්වන දිනයේදී කිරිබඩ පාත්‍රය පූජා කිරීමෙන් අවසන් කරයි. මේදින උදෑසන පෙරදා ගොඩමුන්න ධර්මශාලාවේදී පිළියෙළ කරගත් දානය හේවිසි පූජාවෙන් ධර්මශාලාවේ සිට ගෙනවිත් ගොඩමුන්නේ 'විමනේ කුඹුරේ' තබා ඇති පාත්‍රයට පුරවනු ලබයි. මේ සඳහා කැපවූ පිරිමි ආවතේවකරුවන් මුකවාඩම් සහිතව මෙම කටයුතු සිදු කරයි. දාන පාත්‍රය පිරවීමට පෙර රැස්ව සිටින පිරිස පංච ශීලයේ පිහිටුවා සමන් දෙවියන් උදෙසා කන්නලව් කර දානය පුරවනු ලබයි. පසුව එම දාන පාත්‍රය ලී මත තබා බැඳ පෙරවරු 9.30ට පමණ නැවතත් මිනිසුන් පංච ශීලයේ පිහිටුවා මඟුල් බෙර වයා අවසානයේ පිරිමි පාර්ශවය පමණක් ඔසවාගෙන සගමට රැගෙන යනු ලබයි. මෙම අධ්‍යයනයේදී අතීත සම්ප්‍රදායන් ආරක්ෂා කරමින් දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට මෙම කටයුතු සිදු කරන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** *හම්බා කෙටීම, කිරිබඩ පාත්‍ර පූජාව, ඓතිහාසික, සම්ප්‍රදායන්, සිරිත් විරිත්*